# කවිය හා බැඳුණු හැවැන්දෙණියේ කැඩුම් බිඳුම් වෙදකම

පාරම්පරික වෛද්‍ය පී. ආර්. සෙනෙවිරත්න

වර්තමානයේ කැඩුම් බිඳුම් වෙදකම යනුවෙන් හඳුන්වනු ලබන්නේ අතීතයේ දී බින්න රෝග චිකිත්සාව ලෙස හැඳින් වූ රෝග අවස්ථාවයි. ඇට නැතහොත් අස්ථි පොඩි වී තිබුණ ද දින කිහිපයක දී ඇට පැස්සීමේ ක්‍රම සිංහල වෙදකම සතුව පවතී. වර්තමානයේ දී සමාජයේ බොහෝ පිරිසක් රෝහල් කරා ප්‍රතිකාර සඳහා යොමු වුව ද අවසානයේ තෙල් පත්තු වෙදකම සඳහා සිංහල වෙදකමට යොමු වන්නේ සිංහල වෙදකමෙහි පවතින විස්මිත සුව කිරීමේ හැකියාව පිළිබඳ විශ්වාසය සිත් තුළ පවතින බැවිණි. සිංහල කැඩුම් බිඳුම් වෛද්‍යවරයා භග්න වූ අස්ථි සවිකිරීම, අස්ථි පෑහීම ආදියේ දී වේදනා නාශක භාවිතයෙන් තොර ව ඖෂධ මගින් හා ඊට අමතර ව යන්ත්‍ර මන්ත්‍ර වැනි ගුප්ත ශාස්ත්‍රීය අංග භාවිතයෙන් වේදනාව සමනය කරයි.

හැවැන්දෙණිය පාරම්පරික කැඩුම් බිඳුම් වෛද්‍ය ශාස්ත්‍රය හා සම්බන්ධ බින්න රෝග චිකිත්සාව ලෙස හැඳින් වූ වෛද්‍ය ශාස්ත්‍රයෙහි දැනට පවතින්නේ හය වන වෙද පරම්පරාවයි. පාරම්පරික ව කවියෙන් පවසන ලද වෛද්‍ය ක්‍රම තුළ වෛද්‍ය ශාස්ත්‍රය මෙන් ම එහි ඉතිහාසය ද ලිය වී ඇත. ඒ අනුව මෙම බින්න රෝග චිකිත්සාව බටුවන්තුඩාවේ ගුරුතුමා විසින් රචනා කර ඇත. එහි සඳහන් අයුරු කැඩුම් බිඳුම් වෙදකමෙහි මුලට යෙදන පත්තුවක් ලෙස බෝදි පොතු, කැටකෑල පොතු, අරක්කු, කිතුල් පැණි, මී පැණි. අරළු, පස්කුළු ආදිය යොදා කරන පත්තුවක් සඳහන් කළ හැකිය.

තිලොගුරු මුනි ස ඳ
තිසරණ පිහිටුවා ඉ ඳ
ඉඳිකටු මල්ලෙන් අහස ද
දුටු ලෙස කියමි කවි බැ ඳ

පටුනු පොත් එක්ව න
බින්න රෝගය චිකිස්සා ගෙ න
බටුවන්තුඩාවේ ගුරු මෙලෙසි න
බින්න රෝගේ වරද හැර දු න

ලොව සත දනන් හ ට
බියගෙන වැටී බිඳුව ට
පාලි පොත් එක්කො ට
බෙහෙත් පවසමි මදක් කවිකො ට

බෝදිද කැටකෑල පොතු ගෙ න
කොටා ඉස්මට අරක්කුත් ගෙ න
කිතුල් පැණි මී පැණියෙ න
අරළු ද පස්කුළු ද ගෙ න

ඉඟුරු මිරිස් අබ වද කහ සුදුලූ නු
අඹරා යොදා ඇර ගෙ න
පස්තෙල් සමඟ කකාරා ගෙ න
පොවා ඇඟ ගල්ල න
බින්න රෝගය මුලට සි න

මේ ආදී ලෙස විශිෂ්ට වෛද්‍ය කර්ම රැසක් මෙම පරම්පරාව සතු ව පවතින අතර එම දේශීය දැනුම ආරක්ෂා කර ගැනීම හා ඉදිරියට පවත්වා ගැනීම අප සතු වගකීමකි.